# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

මගේ අංකය / எனது இல / My No } MOD/SD/2021(134)
ඔබේ අංකය / உமது இல / Your No }

තැ. පෙ. / த. பெ. / P.O. Box 572
දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8
ලේකම් / செயலாளர் / Secretary: දුර./தொலை./Tel.: 011 2981154; ෆැක්ස්/தொ.ந./Fax.: 011 2541529; ඊ මේල්/மி.அ./Email : secdefence@defence.lk
දිනය / திகதி / Date } 2021 මැයි මස 18 දින


ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී
යුද්ධ හමුදාපති
නාවික හමුදාධිපති
ගුවන් හමුදාධිපති

<u>විශ්‍රාමික ත්‍රිවිධ හමුදා රණවිරුවන්ගේ දූ දරුවන් ආරක්ෂක සේවා විද්‍යාල වෙත ඇතුළත් කිරීමට අනුමැතිය ලබාදීම</u>

1. ත්‍රිවිධ හමුදාවන්හි ගෞරවාන්විත සේවයක් ඉටුකර විශ්‍රාම ගන්වන ලද රණවිරුවන්ගේ දූ දරුවන් සඳහා ආරක්ෂක සේවා විද්‍යාල වෙතින් අධ්‍යාපනය ලැබීමට අවස්ථාවක් ලබාදීමට 2021 මාර්තු 15 දින පවත්වන ලද ආරක්ෂක සේවා විද්‍යාල කළමණාකරන මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී.

2. එම වරප්‍රසාදය සඳහා හිමිකම් ලබන ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් සහ අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ලියකියවිලි පිළිබඳ විස්තර ඇතුළත් ලේඛණය මෙම ලිපියට ඇමුණුම 'අ' වශයෙන් යා කර ඇත.

3. මෙම මහඟු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ලබාගැනීම පිණිස ත්‍රිවිධ හමුදාවන්හි රාජකාරීන් ඉටුකර විශ්‍රාම ගන්වන ලද සියලුම රණවිරුවන් දැනුවත් කිරීමට කටයුතු සලසන මෙන් මින් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත්:
සභාපති, ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය
අතිරේක ලේකම් (රාජ්‍ය ආරක්ෂක), රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, ආරක්ෂක සේවා විදුහල

MOD/SD/2021 ( 134 )
හා 2021.05.14 දිනැති ලිපියට
ඇමුණුම 'අ' වශයෙන්

## විශ්‍රාමික ත්‍රිවිධ හමුදා රණවිරුවන් තම දූ දරුවන් ආරක්ෂක සේවා විද්‍යාල වෙත ඇතුළත් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් හා අවශ්‍යතා

1. විශ්‍රාමික ත්‍රිවිධ හමුදා රණවිරුවන්ගේ දූ දරුවන් ආරක්ෂක සේවා විද්‍යාල වෙත ඇතුළත් කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීමට ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2021.03.05 දින ආරක්ෂක අමාත්‍යාංශයේදී පවත්වන ලද ආරක්ෂක සේවා විද්‍යාල කළමණාකරන මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

2. මෙම වරප්‍රසාදය හිමිවීම සඳහා ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් පහත සඳහන් පරිදිවේ.

අ. <u>ත්‍රිවිධ හමුදා විශ්‍රාමික අධිකාරිලත් නිලධාරීන් සහ නිලධාරිනියන්.</u>

(1) පිරිමි නිලධාරීන් අවම වශයෙන් වසර 20ක් හෝ ඊට වැඩි ගණනීය හා බරපතල විනය කඩකිරීම් රහිත සේවා කාලයක් ද, කාන්තා නිලධාරිනියන් අවම වශයෙන් වසර 15 ක් හෝ ඊට වැඩි ගණනීය හා බරපතල විනය කඩකිරීම් රහිත සේවා කාලයක්ද සපුරා සේවා විශ්‍රාම වැටුපක් සහිතව හමුදා සේවයෙන් විශ්‍රාම ගන්වා තිබීම.

(2) විශ්‍රාමික නිලධාරී/නිලධාරිනිය තමා සක්‍රිය සේවයේ යෙදී සිටියදී අයත්වූ හමුදා/රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමයේ සාමාජිකත්වය ලබා තිබිය යුතුය.

(3) සක්‍රිය සේවයේ යෙදී සිටියදී ක්‍රියාන්විත රාජකාරීන්ට අදාල නොවන වෙනත් වෛද්‍ය හේතුන්මත ආබාධිතව වැටුප් හා විශ්‍රාම වැටුපක් සහිතව හමුදා සේවයෙන් විශ්‍රාම ගන්වන ලද අධිකාරිලත් නිලධාරීන් හා නිලධාරිනියන් හට මෙම වරප්‍රසාදය හිමි නොවනු ඇත.

(4) විශ්‍රාම වැටුපක් සහිතව හෝ රහිතව විනය හේතුන්මත සේවයෙන් අනිවාර්යය විශ්‍රාම ගන්වන ලද හෝ සේවයෙන් අස්කරන ලද කිසිඳු අධිකාරිලත් නිලධාරියෙකුට හෝ නිලධාරිනියකට මෙම වරප්‍රසාදය හිමි නොවනු ඇත.

ආ. <u>ත්‍රිවිධ හමුදා විශ්‍රාමික සෙසුනිළයන්</u>

(1) පිරිමි අයවළුන් අවම වශයෙන් වසර 22ක් හෝ ඊට වැඩි හා බරපතල විනය කඩකිරීම් රහිත සේවා කාලයක්ද, කාන්තා අයවළුන් අවම වශයෙන් වසර 15ක් හෝ ඊට වැඩි බරපතල විනය කඩකිරීම් රහිත සේවා කාලයක් සපුරා සේවා විශ්‍රාම වැටුපක් සහිතව හමුදා සේවයෙන් අස්වී තිබිය යුතුය.

(2) තමා සක්‍රීය සේවයේ යෙදී සිටියදී අයත්වූ හමුදා/රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමයේ සාමාජිකත්වය ලබා තිබිය යුතුය.

(3) සක්‍රිය සේවයේ යෙදී සිටියදී ක්‍රියාන්විත රාජකාරීන්ට අදාල නොවන වෙනත් වෛද්‍ය හේතුන්මත ආබාධිතව වැටුප් හා විශ්‍රාම වැටුපක් සහිතව හමුදා සේවයෙන් අස්කරන ලද සෙසුනිළයන් හට මෙම වරප්‍රසාදය හිමි නොවනු ඇත.

(4) සේවා විශ්‍රාම වැටුපක් සහිතව හෝ රහිතව විනය හේතුන්මත සේවයෙන් අනිවාර්යය විශ්රාම ගන්වන ලද හෝ අස්කරන ලද කිසිදු සෙසුනිළයෙකු හට මෙම වරප්‍රසාදය හිමි නොවනු ඇත.

3. පුරප්පාඩු වෙන්කිරීම සහ සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය පහත සඳහන් පරිදි සිදුවිය යුතුය.

අ. <u>ප්‍රාථමික අංශය.</u>

(1) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත වෙන්කර සක්‍රිය සේවයේ නිරත සාමාජිකයන් විසින් සම්පූර්ණ නොකරන ලද 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පුරප්පාඩු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතද, ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත වෙන්කර සම්පූර්ණ නොකරන ලද පුරප්පාඩු ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතද, ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත වෙන්කර සම්පූර්ණ නොකරන ලද පුරප්පාඩු ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතද ඉහත 2 ඡේදය යටතේ සඳහන් සුදුසුකම් සපුරන ලද විශ්‍රාමික රණවිරුවන්ගේ දරුවන් සඳහා වෙන්කර දීමට හැකියාව ඇත.

(2) අදාල අයදුම්පත් හමුදා/රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමය වෙතින් තම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක/අණදෙන නිලධාරීගේ නිර්දේශ සහිතව (එක් එක් හමුදාවන්ට අදාල පරිදි) සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) සුභසාධක අධ්‍යක්ෂ විසින් නිර්දේශිත විශ්‍රාමික රණවිරුවන්ගේ නාම ලේඛණ ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) ආරක්ෂක අමාත්‍යාංශය විසින් අනුමත නාමලේඛණයට ඇතුළත් ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් විදුහල්පතිවරයා විසින් කැඳවන ලද සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීමෙන් පසු පොරොත්තු ලේඛණයේ රඳවා පවතින පුරප්පාඩු මත සුභසාධක අධ්‍යක්ෂවරුන් වෙත දැනුම් දී දරුවන්ගේ බඳවාගැනීම් කටයුතු විදුහල්පතිවරයා විසින් සිදුකරනු ලැබේ.

ආ. <u>ද්විතීයික අංශය (6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා).</u>

(1) ශ්‍රී ලංකා යුධ, නාවික සහ ගුවන් හමුදා වෙත ආරක්ෂක සේවා විද්‍යාලයන්හි 6 ශ්‍රේණිය සඳහා වෙන්කර දුන් එහෙත් සක්‍රිය සේවයේ නිරත සාමාජිකයන් විසින් සම්පූර්ණ නොකරනලද පුරප්පාඩු ප්‍රමාණය අදාල සේවාවන්හි විශ්‍රාමික රණවිරුවන්ගේ දරුවන් වෙත වෙන්කරදීමට හැකියාව ඇත.

(2) අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තමා අයත් හමුදා/රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමය වෙතින්, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක/අණදෙන නිලධාරීගේ නිර්දේශය සහිතව (එක් එක් හමුදාවන්ට අදාල පරිදි) සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සියළුම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සක්‍රිය සේවයේ යෙදී සිටින ත්‍රිවිධ හමුදා සාමාජිකයන් ඉදිරිපත් නොවන අවස්ථාවන්හිදී අදාල හමුදාව වෙත අයත් පුරප්පාඩු එම හමුදාවන්හි ඉහත 2 ඡේදය යටතේ සඳහන් සුදුසුකම් සපුරන ලද විශ්‍රාමික රණවිරුවන්ගේ දරුවන් වෙත වෙන්කර දීමට ක්‍රියා කරනු ලැබේ.

(4) අදාල අයදුම්පත් තම හමුදා/රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමය වෙතින් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක/අණදෙන නිලධාරීගේ නිර්දේශය (එක් එක් හමුදාවන්ට අදාල පරිදි) සහිතව සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(5) සුභසාධක අධ්‍යක්ෂ විසින් නිර්දේශිත විශ්‍රාමික රණවිරුවන්ගේ නාමලේඛණය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

(6) ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුමත නාමලේඛණයට ඇතුළත් ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් විදුහල්පතිවරයා විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීමෙන් පසු තෝරාගත් දරුවන් ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය මත ආරක්ෂක සේවා විද්‍යාලයන්හි 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා පංති සඳහා ඇතුළත් කර ගනු ලැබේ.

ඇ. <u>උසස් පෙළ පංති (12 සහ 13 ශ්‍රේණි).</u>

(1) ආරක්ෂක සේවා විද්‍යාලයන්හි පහත සඳහන් උසස් පෙළ විෂයය ධාරාවන් පවත්වාගෙන යන අතර අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අදාළ විෂයය ධාරාව හැදෑරීමට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරාලන ලද විශ්‍රාමික ත්‍රිවිධ හමුදා රණවිරුවන්ගේ දරුවන්ට පුරප්පාඩු පවතින අදාළ විෂයය ධාරාවන් ආරක්ෂක සේවා විද්‍යාලයන්හි හැදෑරීමට අයදුම් කළ හැකිවේ.

- (අ) ජීව විද්‍යා (Bio) විෂයය ධාරාව (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය).
- (ආ) ගණිතය (Maths) විෂයය ධාරාව (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය).
- (ඇ) වාණිජ විෂයය ධාරාව (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය).
- (ඈ) කලා විෂයය ධාරාව (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය).
- (ඉ) තාක්ෂණ විෂය ධාරාව.

(2) ශ්‍රී ලංකා යුද්ධ, නාවික හා ගුවන් හමුදා වෙත ඉහත 3 ඇ (1) ඡේදය යටතේ සඳහන් විෂයය ධාරාවන් සඳහා වෙන්කර දුන් එහෙත් සක්‍රිය සේවයේ නිරත සාමාජිකයන් විසින් සම්පූර්ණ නොකරන ලද පුරප්පාඩු ප්‍රමාණය අදාළ හමුදාවන්හි විශ්‍රාමික රණවිරුවන්ගේ දරුවන් සඳහා වෙන්කර දිය හැක.

(3) අදාළ අයදුම්පත් තමා අයත් හමුදාව/රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමය වෙතින් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක/අණදෙන නිලධාරීගේ නිර්දේශය (එක් එක් හමුදාවන්ට අදාල පරිදි) සහිතව සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) සුභසාධක අධ්‍යක්ෂ විසින් නිර්දේශිත නාමලේඛණය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

(5) ආරක්ෂක අමාත්‍යාංශය විසින් අනුමත නාමලේඛණයට ඇතුළත් ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් විදුහල්පතිවරයා විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීමෙන් පසු උසස් පෙළ අදාල විෂයය ධාරාවන් හැදෑරීමට අවශ්‍ය සියළු අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති තෝරාගත් දරුවන් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත ආරක්ෂක සේවා විද්‍යාලයන්හි 12 සහ 13 ශ්‍රේණි වෙත ඇතුළත් කරගනු ලැබේ.

4. ඉහත සියළු ශ්‍රේණින් සඳහා තම දරුවන් ඇතුළත් කිරීම පිණිස පහත සඳහන් සහතික හා ලියකියවිලි මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී සහ සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ඡායාස්ථ පිටපත් අයදුම්පත සමග ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

අ. <u>ඉදිරිපත් කළ යුතු සහතික, ලේඛන සහ ලියකියවිලි.</u>

(1) පියාගේ සහ මවගේ උප්පැන්න සහතිකය (ග්‍රාම සේවක නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද).

(2) විවාහ සහතිකය (දික්කසාද වී ඇත්නම් දික්කසාද සහතිකය).

(3) දරුවාගේ උප්පැන්න සහතිකය.

(4) ඡන්ද හිමි නාමලේඛණයේ ඡායාස්ථ පිටපතක්.

(5) ග්‍රාමසේවා නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද).

(6) ජාතික හැඳුනුම්පත්හි ඡායාස්ථ පිටපත් (දිවුරුම් ප්‍රකාශයක් මගින් සහතික කළ යුතුය).

(7) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කර ඇති හැඳුනුම්පතෙහි ඡායාස්ථ පිටපතක් (ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද).

(8) විශ්‍රාමික හමුදා සාමාජිකයන් වෙත තමා සේවය කරන ලද හමුදාව වෙතින් විශ්‍රාමික අයවළුන්ට නිකුත්කරන හැඳුනුම්පතෙහි ඡායාස්ථ පිටපතක් සහ සේවා සහතිකයේ මුල් පිටු දෙකෙහි ඡායාස්ථ පිටපතක්.

ආ. තම හමුදාව ඒකකය/රෙජිමේන්තුව/අංශය යටතේ සේවයේ යෙදී සිටියදී උපන් දරුවන්ගේ විස්තර ලේඛනගත කර නොමැති සහ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු උපන් දරුවෙකු ආරක්ෂක සේවා විද්‍යාල වෙත ඇතුළත් කිරීමට අයදුම්කරන ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවෙකුගේ ඉහත 4 'අ' ඡේදය යටතේ සඳහන් ලියකියවිලි සහ ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිතව නිකුත්කරන ලද ලිපියක් සමග දරුවාගේ ජීවදත්ත නිවැරදි බවට ග්‍රාම සේවක නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිතව නිකුත්කරන ලද ලිපියක් සමග දරුවාගේ උප්පැන්න සහතිකය දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සේවයෙන් විශ්‍රාමගත් අවස්ථාවේදී අවිවාහක තත්ත්වයේ සිට පසුව විවාහවී දරුවන් ලැබූ අයවළුන් ඉහත 4 'අ' ඡේදය යටතේ සඳහන් ලියකියවිලිවලට අමතරව දිවුරුම් ප්‍රකාශයක් මගින් විවාහ සහතිකය, භාර්යාවගේ උප්පැන්න සහතිකය හා දරුවන්ගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය.

ඈ. සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව නීත්‍යානුකූලව දික්කසාද වූ අයවළුන් ඉහත 4 'අ' ඡේදය යටතේ සඳහන් ලියකියවිලි සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් අදාල දික්කසාද තාඩු තීන්දුවේ පිටපතක්, දෙවැනි විවාහයේ විවාහ සහතිකය, භාර්යාවගේ උප්පැන්න සහතිකය සහ දරුවාගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය.

ඉ. උසාවි තීන්දුවක් මගින් නීත්‍යානුකූලව ස්ථිරව දරුකමට හදාගත් දරුවන් වෙනුවෙන් ඊ පිළිබඳ උසාවි තීන්දුවේ පිටපතක් දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉහත 4 'අ' ඡේදය යටතේ සඳහන් ලියකියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.

ඊ. දරුවාගේ පියා සහ මව විදේශගතව සිටින අවස්ථාවකදී හෝ දෙමාපියන්ගෙන් එක් අයෙකු ජීවතුන් අතර නොමැති විට සහ අනෙක් පුද්ගලයා විදේශගතව ඇති විටකදී තාවකාලිකව දරුවාගේ භාරකාරීත්වය උසුලන්නාට දරුවාගේ දෙමාපියන් මාර්ගයෙන් ඉල්ලුම් කළ හැකි අතර ඊ සඳහා දරුවාගේ පියා සහ මව විදේශගතවී සිටීම හෝ ජීවතුන් අතර නොමැති වීම, ඉහත 4 'අ' ඡේදය යටතේ සඳහන් ලියකියවිලි සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතුය.

5. ආරක්ෂක සේවා විද්‍යාල වෙත දරුවන් ඇතුළත් කිරීමට අයදුම්කරන පහත සඳහන් වර්ගීකරණයට අයත් ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි විය යුතුය.

අ. ඇතුළත් කිරීමට අපේක්ෂිත දරුවාගේ වැඩිමහල් සහෝදර/සහෝදරියන් දැනටමත් ආරක්ෂක සේවා විද්‍යාල වෙත ඇතුළත් කර අධ්‍යාපනය ලබමින් සිටීම.

ආ. ඇතුළත් කිරීමට අපේක්ෂිත දරුවාගේ පියා සහ මව යන දෙදෙනාම ත්‍රිවිධ හමුදාවන්හි සේවය කර අවශ්‍ය සුදුසුකම් සපුරාලන ලද විශ්‍රාම ගන්වන ලද අයවළුන් වීම.

6. තම දරුවන් ආරක්ෂක සේවා විද්‍යාලය වෙත ඇතුළත් කිරීමට වරප්‍රසාදය හිමිවන සියළුම ත්‍රිවිධ හමුදා විශ්‍රාමික රණවිරුවන් විසින් අත්සන් කළ යුතු අවබෝධතා ගිවිසුම ඇමුණුම 'ආ' වශයෙන්ද දරුවන් ඇතුළත් කිරීමට ඉදිරිපත් කළ යුතු අයදුම්පත් පහත සඳහන් පරිදි මෙම ලේඛණයට යා කර ඇත.

අ. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා දරුවන් ඇතුළත් කිරීමේ අයදුම්පත - ඇමුණුම 'ඇ'.

ආ. 6 ශ්‍රේණිය වෙත දරුවන් ඇතුළත් කිරීමේ අයදුම්පත - ඇමුණුම 'ඈ'.

ඇ. 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දරුවන් ඇතුළත් කිරීමේ අයදුම්පත - ඇමුණුම 'ඉ'.

ඈ. අ.පො.ස (උසස් පෙළ) පංති සඳහා දරුවන් ඇතුළත් කිරීමේ අයදුම්පත - ඇමුණුම 'ඊ'.